යොමු අංකය : ව/පස/2/1/9.

## වයඹ පළාත් සභාව

### වයඹ පළාතේ පළාත් සභාවේ 1993 අංක 01 දරන වයඹ සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් 1993.01.19 වැනි දින සම්මත කරන ලදුව, 1993.09.16 වැනි දින ආණ්ඩුකාරවරයා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියළුදෙනාගේ දැනගැනීම පිණිස මෙහි පහත පළ කරමි.

සම්පත් එම්. දසනායක,<br>ලේකම්,<br>වයඹ පළාත් සභාව.

1993 ඔක්තෝබර් මස 13 වැනි දින,<br>කුරුණෑගල,<br>වයඹ පළාත් සභාවේ සභා කාර්යාලයේ දී ය.

### වයඹ පළාතේ පළාත් සභාවේ 1993 අංක 01 දරන වයඹ සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය

*වයඹ පළාතේ කෘෂිකර්මාන්තය, සත්ත්ව පාලනය, ධීවර කර්මාන්තය, වන වගාව සහ ඒ ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම පිණිස වයඹ සංවර්ධන අධිකාරිය පිහිටුවීම සඳහාත් එයට අදාළ වූ නැතහොත් ආනුෂංගික වූ කරුණු ගැන විධිවිධාන සැලැස්වීම සඳහාත් වූ ප්‍රඥප්තියකි.*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ආරම්භය හා ක්‍රියාත්මක වන දිනය.

01. මෙම ප්‍රඥප්තිය [illegible] ප්‍රඥප්තිය වශයෙන් [illegible], විෂය භාර අමාත්‍යවරයා විසින් [illegible] පළ කරනු ලබන නියමයක් මගින් ප්‍රකාශයට පත් කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක වන්නේ ය.

*I වැනි කොටස*

*වයඹ සංවර්ධන අධිකාරියේ සංයුතිය, අරමුණු, බලතල හා කාර්යයන්*

වයඹ සංවර්ධන අධිකාරිය.

02. මෙම ප්‍රඥප්තියෙහි මින් මතු අධිකාරිය වශයෙන් සඳහන් කෙරෙන, වයඹ සංවර්ධන අධිකාරිය නමින් හැඳින්වෙන අධිකාරියක් මෙයින් පිහිටුවනු ලැබේ.

අධිකාරිය සංස්ථාපිත ආයතනයක් බව.

03. අධිකාරිය, අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති, ස්වකීය නාමයෙන් නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමට හැකි සංස්ථාපිත ආයතනයක් වේ.

අධිකාරියේ අරමුණු.

04. අධිකාරියේ අරමුණු පහත සඳහන් වේ:–

(අ) වයඹ පළාතේ කෘෂිකර්මාන්තයට, සත්ත්ව පාලනය, ධීවර කර්මාන්තයට, වන වගාවට සහ ඉහත ක්ෂේත්‍ර සඳහම් කර්මාන්ත වලට අනුබල දීම හා ඒවා දියුණු කිරීමට සහායවීම.

(ආ) දේශීය හා විදේශීය ආයෝජකයන් වයඹ පළාතට ඇදගැනීම හා ඵලදායී ව්‍යාපෘති හඳුන්වා දීමෙන් හා අවශ්‍ය උපදෙස් ලබා දීමෙන් එවැනි ආයෝජකයන්ට සහාය වීම.

(ඇ) පෙළඹවීම් ක්‍රම හා වේගවත් ආර්ථික ක්‍රියාකාරකම් සඳහා උචිත වූ මූලික පහසුකම්වලින් හෙබි හිතකර ආයෝජන වාතාවරණයක් ඇති කිරීම.

(ඈ) ව්‍යාපාරික කුශලතා පිළිබඳ පුහුණු කටයුතු හා අධ්‍යාපනික කටයුතු කරගෙන යාම, පුහුණු වැඩසටහන් සම්මන්ත්‍රණ, සම්මේලන වැඩමුළු හා අධ්‍යයන චාරිකා සංවිධානය කිරීම, දැනුම හා තොරතුරු පතුරුවාලීම සහ වෙනත් වැඩ සටහන් ඇති කිරීම.

(ඉ) වයඹ පළාත තුළ නිෂ්පාදිත භාණ්ඩ සඳහා වෙළඳපොලවල් ඇති කිරීම හා ඒ සඳහා අනුබල දීම සහ ගිවිසුම් හෝ සම්බන්ධතා ඇති කිරීම.

(ඊ) අලෙවිකරණය සම්බන්ධයෙන් ආධාර අපේක්ෂා කරන දේශීය නිෂ්පාදකයින්ගෙන් ලැබෙන ඉල්ලීම් ගැන ක්‍රියා කිරීම හා අලෙවි අවශ්‍යතා ඇති අංශයන්හි නිෂ්පාදනයන් දිරි ගැන්වීම.

(උ) කෘෂිකර්මාන්තය, සත්ත්ව පාලනය, ධීවර කර්මාන්තය හා වනවගා යන ක්ෂේත්‍රයන්හි අවශ්‍යතාවලට ගැලපෙන ආකාරයේ ශිල්ප ඥානය ඇතිකර ගැනීම, හැඩගස්වා ගැනීම හා නවීකරණය පිළිබඳව උපදෙස් දීම හා මඟපෙන්වීම සහ එවැනි ශිල්ප ඥානය සංවර්ධනය කිරීමට හා පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට මූලාධාර ලබාදීම හා වයඹ පළාතේ නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා කෘෂිකාර්මික, සත්ත්ව පාලන, ධීවර හා වනවගා ක්ෂේත්‍රයන්හි පර්යේෂණ කටයුතුවලට අනුග්‍රහය දැක්වීම හා භාර ගැනීම.

(ඌ) ගුණාත්මක සංවර්ධනය හා කාර්ය සාධකතාව වැඩි දියුණු කිරීම සඳහා කළමණාකරණය, නිෂ්පාදනය හා බෙදාහැරීම පිළිබඳ නව ක්‍රම උපයෝගී කර ගැනීම සඳහා අනුබල දීම.

(එ) එක් එක් කර්මාන්ත අංශ උදෙසා නිශ්චිත කෙටිකාලීන හා දිගුකාලීන ක්‍රියාත්මක සැලසුම් වර්ධනය කිරීම භාර ගැනීම.

(ඒ) වයඹ පළාතේ කෘෂිකර්මාන්තය, සත්ත්ව පාලනය, ධීවර හා වන වගා ආශ්‍රිත කර්මාන්ත සඳහා බුද්ධි මණ්ඩලයක් වශයෙන් කටයුතු කිරීම.

අමාත්‍යවරයාට උපදෙස් දීම.

05. අධිකාරියට සම්බන්ධ සියළු කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් අධිකාරිය වෙත යොමු කරනු ලබන කරුණු සම්බන්ධයෙන් හෝ අමාත්‍යවරයාට උපදෙස් දීම අධිකාරියේ වගකීම විය යුතුය.

අධිකාරියේ අරමුණු සපුරාගැනීමට සිය බලතල පැවරිය හැකි බව.

06. (1) අධිකාරියේ අරමුණු සපුරා ගැනීම හා වගකීම් ඉටුකිරීම සඳහා ප්‍රමාණවත් බලතල හා අයිතිවාසිකම් තිබිය යුතුය.

(2) අධිකාරියේ කාර්ය උදෙසා යම් නිශ්චිල දේපලක් අවශ්‍ය වුවහොත්, අමාත්‍යවරයා විසින් එම කාර්ය අනුමත කර ගැනීමේ පනත යටතේ එබඳු ඉඩමක් අත්පත් කර ගත හැක. එසේවුව ද එම ඉඩම සඳහා අධිකාරිය විසින් වන්දි ගෙවිය යුතුය.

(6) (අ) කෘෂිකර්මාන්තය, සත්ත්ව පාලනය, ධීවර හා වන විනාශයෙන් දිවිගැනීමේ හා සංවර්ධනය සඳහා මධ්‍යස්ථාන පිහිටුවීම හා ක්‍රියාත්මක කිරීම ;

(ආ) අධිකාරියේ අරමුණු සපුරා ගැනීම සඳහා හවුල් ගිවිසුම් වලට හෝ කොන්ත්‍රාත් ගිවිසුම්වලට හෝ සහයෝගිතා ගිවිසුම් වලට හෝ ඇතුළත් වීම ;

(ඇ) කෘෂිකර්මය, සත්ත්ව පාලනය, ධීවර හා වන වගා අංශයන්හි සංවර්ධනයේ සියලු අංශ පිළිබඳව පර්යේෂණ පැවැත්වීම, ඒ සඳහා සහායවීම, සම්බන්ධීකරණය හා අනුබල දීම ;

(ඈ) අධිකාරිය විසින් සපයනු ලබන සේවා වෙනුවෙන් ගාස්තු හෝ කුලී අය කිරීම ;

(ඉ) අධිකාරියට කරනු ලබන සේවා වෙනුවෙන් ගාස්තු හෝ කුලී ගෙවීම ;

(ඊ) තම සේවකයන් පත්කර ගැනීම, සේවයේ යෙදවීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම හා ඔවුන්ගේ විනය පාලනය කිරීම ;

(උ) සිය සේවකයන් පත්කිරීම, පුහුණු කිරීම, උසස් කිරීම, ඔවුනට පාරිශ්‍රමික ගෙවීම, ඔවුන්ගේ විනය පාලනය, හැසිරීම සහ ඔවුන්ට නිවාඩු ලබාදීම පිළිබඳ රීති සම්පාදනය කිරීම ;

(ඌ) සිය සේවකයන් සඳහා කාර්ය නියමයන් ඇති කිරීම, ඔවුන්ගේ කාර්ය සාධනය ඇගැයුම සහ අවශ්‍ය පිළියම් යෙදීම ;

(එ) අධිකාරියේ අරමුණු සපුරා ගැනීම සඳහා අවශ්‍ය යන්ත්‍රසූත්‍ර සහ උපකරණ ආනයනය කිරීම හා කාර්යාංශයේ කටයුතු සඳහා අවශ්‍ය වියහැකි උපකරණ අරමුදල් කාර්ය මණ්ඩලය සහ වෙනත් ආධාර පිළිගැනීම ;

සඳහා කටයුතු කළ හැකිය.

07. සිය කාර්යයන් සාර්ථකව ඉටුකිරීම සඳහා අවශ්‍ය අංශ සහ නියෝජිතායතන, අවශ්‍ය විය හැකි පරිදි අධිකාරිය විසින් පිහිටුවා පවත්වාගෙන යා හැකිය. කාර්යාංශයේ නියෝජිතායතන හා අංශ.

## II වැනි කොටස

### *අධිකාරියේ මණ්ඩලය*

08. මින්මතු මණ්ඩලය වශයෙන් පත්කරනු ලබන අධිකාරියේ මණ්ඩලයක් තිබිය යුතු අතර, එම මණ්ඩලය අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයන් එකළොස් (11) දෙනෙකුගෙන් සමන්විත විය යුතුය. මණ්ඩලය.

09. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු, පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතනයක සාමාජිකයෙකු මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් පත්කිරීමට සුදුසුකම් නොලබයි. නුසුදුසුකම්.

10. සාමාජික තනතුරු අත් හැරියහොත් හෝ නියමිත කාලයට පෙර අමාත්‍යවරයා විසින් ඉවත් කරනු ලැබුවහොත් හෝ හැර සෑම සාමාජිකයෙක්ම අවුරුදු තුනක (3) කාලයකට සිය ධුරය දරයි. සාමාජිකයින්ගේ ධුර කාලය.

11. අසනීප නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් හේතුවක් නිසා හෝ සිය රාජකාරී ඉටු කිරීමට යම් සාමාජිකයෙකුට තාවකාලිකව අපොහොසත් වේ නම්, අමාත්‍යවරයා විසින් වෙනත් අයෙකු සාමාජිකයෙකු වශයෙන් පත්කළ හැකිය. වැඩ බලන සාමාජිකයන් පත් කිරීම.

12. අමාත්‍යවරයා අමතන ලිපියක් එවා සාමාජිකයෙකුට තම ධුරයෙන් ඉවත්විය හැකි අතර, උචිත යයි අමාත්‍යවරයාට හැඟී යන්නේ නම් යම් සාමාජිකයෙකු මණ්ඩලයෙන් ඉවත් කළ හැකිය. සාමාජිකයින්ගේ ධුර හිස්වීම.

13. කාලයාගේ ඇවෑමෙන් තනතුරෙන් ඉවත්ව යන සාමාජිකයෙකු නැවත පත්කරනු ලැබිය හැකිය. සාමාජිකයන් නැවත පත්කිරීම.

14. මණ්ඩලයේ සභාපතිවරයා අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය යුතුය. සභාපතිවරයාට තාවකාලිකව ස්වකීය ධුරයේ කාර්යයන් ඉටුකළ නොහැකි වේ නම් අමාත්‍යවරයා විසින් සාමාජිකයන් අතුරෙන් යම් අයෙකු වැඩ බලන සභාපති වශයෙන් පත්කරනු ලැබිය හැකිය. මණ්ඩලයේ සභාපති.

15. (1) මණ්ඩලය මසකට අවම වශයෙන් එක් වරක් හෝ රැස්විය යුතුය. මණ්ඩල රැස්වීම.

(2) සෑම මණ්ඩල රැස්වීමක් ම පිළිබඳ ලිඛිත දැන්වීමක් එක් එක් සාමාජිකයාට රැස්වීම් දිනට දින හතකට පෙර ලැබෙන්නට සැලැස්විය යුතු අතර, එම රැස්වීමේ දී කිරීමට නියමිත කාර්යයන් කවරේද යන්න එහි සඳහන් විය යුතුය.

(3) මණ්ඩලයේ රැස්වීමක් පැවැත්වීම සඳහා [illegible] මණ්ඩලයේ සාමාජිකයන් තිදෙනෙකු විසින් ලිඛිතව ඉල්ලීමෙන් පසුව දින හතක් ඇතුළත සභාපතිවරයා විසින් මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතුය.

(4) මණ්ඩලයේ රැස්වීමක දී යම් කරුණක් පිළිබඳව කැමැත්ත විමසීමේදී පක්ෂ හා විපක්ෂ ඡන්ද සංඛ්‍යාව සම වේ නම් මුලසුන දරන සභාපතිවරයාට තමන්ගේ ඡන්දයට අමතරව දෙවැනි නැතහොත් තීරක ඡන්දයක් හිමිවේ.

(5) මණ්ඩලයේ රැස්වීම් සඳහා ගණපූරණය සභාපතිවරයා ද ඇතුළුව සාමාජිකයන් සිව් දෙනෙකු වේ.

(6) මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීම හා එම රැස්වීම් වල කටයුතු කරගෙන යාම පිණිස මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව මණ්ඩලය විසින් සිය කාර්ය පරිපාටිය සකස් කරගත හැකිය.

*මණ්ඩලයේ පුරප්පාඩු නිසා එහි කටයුතු බල රහිත නොවන බව.*

16. මණ්ඩලයේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබීම හෝ එහි සාමාජිකයෙකු පත් කිරීම දෝෂ සහිත වීම යන හේතු නිසාම පමණක් මණ්ඩලයේ යම්කිසි ක්‍රියාවක් හෝ ක්‍රියාවලියක් හෝ බල රහිත යැයි නොසැලකිය යුතුය.

*මණ්ඩලයේ සාමාජිකයින්ගේ පාරිශ්‍රමික.*

17. වයඹ පළාත් සභාවේ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ආකාරයට හා ප්‍රමාණවලට අනුව මණ්ඩලයේ සාමාජිකයින්ට පාරිශ්‍රමික ගෙවිය හැකිය.

*අධිකාරියේ පොදු මුද්‍රාව.*

18. (1) අධිකාරියේ පොදු මුද්‍රාව කලින් කලට මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අයකුගේ භාරයේ තිබිය යුතුය.

(2) මණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනෙකු ඉදිරියේ දී හැරෙන්නට අධිකාරියේ පොදු මුද්‍රාව යම් සාධන පත්‍රයක හෝ ලියවිල්ලක හෝ නොයෙදිය යුතු අතර, අදාල මණ්ඩල සාමාජිකයින් දෙදෙනා ඔවුන් එම අවස්ථාවේ එහි සිටි බවට සළකුණක් වශයෙන් එම සාධන පත්‍රයෙහි නැතහොත් ලියවිල්ලෙහි තම අත්සන යෙදිය යුතුය.

(3) අධිකාරියේ පොදු මුද්‍රාව යොදන ලද සාධන පත්‍ර හෝ ලියවිලි හෝ පිළිබඳ ලේඛනයක් මණ්ඩලය විසින් පවත්වා ගත යුතුය.

*අමාත්‍යවරයා විසින් මණ්ඩලයට උපදෙස් දීම.*

19. සිය බලතල ක්‍රියාත්මක කිරීමේදී හා වගකීම් ඉටුකිරීමේ දී අමාත්‍යවරයා විසින් කලින් කලට දෙනු ලැබිය හැකි පොදු හෝ නිශ්චිත හෝ උපදෙස් වලට මණ්ඩලය යටත් වනවා මෙන්ම එම උපදෙස් අනුව ක්‍රියා කිරීමට බැඳී සිටී.

*මණ්ඩලය විසින් බලතල හා රාජකාරි පැවරීම.*

20. (1) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන බලතල හා රාජකාරි අධිකාරියේ කවර හෝ සාමාජිකයෙකුට හෝ නිලධාරියෙකුට හෝ පවරා දිය හැකිය.

(2) ඉහත (1) වැනි උප වගන්තිය යටතේ බලය පවරනු ලැබූ අයෙකු මණ්ඩලයේ පොදු හෝ නිශ්චිත හෝ උපදෙස් වලට අනුව තමන්ට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම නැතහොත් රාජකාරි ඉටු කිරීම කළ යුතු වේ.

## *III වැනි කොටස*

### *අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා හා වෙනත් කාර්ය මණ්ඩලය*

*අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා.*

21. (1) අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් පැවරෙන වගකීම් දැරීමට උචිත සුදුසුකම් ඇති මෙම ප්‍රඥප්තියෙහි මින්මතු අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් හඳුන්වන පූර්ණකාලීන නිලධාරියකු මණ්ඩලය විසින් පත්කළ යුතුය.

(2) අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයක් අධ්‍යක්ෂ ජනරාල්ට ගෙවිය හැකිය.

*අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතල හා රාජකාරි.*

22. (1) අධ්‍යක්ෂ ජනරාල් මණ්ඩලයේ ලේකම් විය යුතු අතර, මණ්ඩල රැස්වීම්වලදී ඔහුට ඡන්දයක් හිමි නොවේ.

(2) අධිකාරියේ එදිනෙද සියලුම පරිපාලන කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා මණ්ඩලයට වගකිව යුතුවේ. මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව–

(අ) අධිකාරිය විසින් සේවයේ යොදවාගෙන ඇති අයගේ කුශලතා වර්ධනය කිරීම ;
(ආ) අධිකාරියේ කාර්යක්ෂමතාවය හා පරමාර්ථ සාක්ෂාත් කිරීමෙහිලා, ඵලදායිතාවය වැඩිදියුණු කිරීම ;
(ඇ) අධිකාරියේ අරමුණු සපුරා ගැනීම පිණිස අවශ්‍ය වන්නා වූ සේවාවන් සංවිධානය කිරීම ;
එකී පරිපාලන කටයුතුවලට අතුළත් විය යුතුය.

(3) මීට අමතරව මණ්ඩලය විසින් අධ්‍යක්ෂ ජනරාල් වෙත පවරනු ලැබිය හැකි බලතල, කාර්යයන් හා රාජකාරි කටයුතු ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතුය.

23. මෙම ප්‍රඥප්තියේ අනිකුත් විධිවිධානවලට යටත්ව– *(අධිකාරියේ සෙසු කාර්ය මණ්ඩලය.)*

(අ) අධිකාරියේ සේවකයන් පත්කිරීම, සේවකයන් පහ කිරීම හා ඔවුන්ගේ විනය පාලනය ගැන ක්‍රියා කිරීම ;

(ආ) එම කාර්ය මණ්ඩලයේ වැටුප්, වේතන හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම ;

(ඇ) එම කාර්ය මණ්ඩලයේ සේවා කොන්දේසි තීරණය කිරීම ;

මණ්ඩලය විසින් කළ හැකිය.

## *IV වැනි කොටස*

## *මුදල් හා ගිණුම්*

24. (1) "වයඹ සංවර්ධන අධිකාරියේ අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් අධිකාරිය විසින් පිහිටුවිය යුතු අතර, එය වයඹ පළාත් සභාවේ වෙනම ගිණුමක් වශයෙන් පවත්වාගෙන යා යුතුය. *(අධිකාරියේ අරමුදල.)*

(2) 1987 අංක 42 දරන පළාත් සභා පනතේ තුන්වැනි කොටසේ විධිවිධාන එම අරමුදලට අදාල විය යුතුය.

(3) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පළාත් සභාව විසින් වරින්වර අනුමත කරන සියලුම මුදල් සහ අධිකාරියේ බලතල, කාර්යයන් හා රාජකාරී ඉටුකිරීමේ දී අධිකාරිය විසින් ලබා ගන්නා සියලුම මුදල් අධිකාරියේ අරමුදලට බැර කළ යුතුය.

25. අධිකාරියේ අරමුණු සපුරා ගැනීම පිණිස හෝ මෙම ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ හෝ එයට පැවරී ඇති බලතල, කාර්යයන්, රාජකාරී ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම හෝ කාර්ය සාධනය සඳහා අරමුදල් යොදාගත හැකිය. *(අරමුදල යෙදවිය හැකි කරුණු.)*

26. එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් සිය ආදායම් හා වියදම් පිළිබඳවත් වෙනත් සියලු ගණුදෙනු පිළිබඳවත් නිසි පරිදි ගිණුම් තැබීමට මණ්ඩලය විසින් සැලැස්විය යුතු අතර, අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ආකාරයට හා තීරණය කරනු ලබන තොරතුරු ඇතුළත් කොට සිය ව්‍යාපාරයට අදාළව ගිණුම් හා සංඛ්‍යා ලේඛන ඇතුළත් වාර්ෂික ප්‍රකාශයක් පිළියෙල කළ යුතුය. *(අධිකාරියේ ගිණුම්.)*

27. අධිකාරියේ මුදල් වර්ෂය ජනවාරි මස 01 වැනි දින සිට දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වේ. *(අධිකාරියේ මුදල් වර්ෂය.)*

28. (1) මුදල් වර්ෂය අවසන් වී මාස 06ක් ඉකුත් වීමට පෙර අදල මුදල් වර්ෂය වෙනුවෙන් අධිකාරියේ ගිණුම්, විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එකී ගිණුම් විගණනයට ඔහුට සහායවීම පිණිස විගණකාධිපති විසින් ඔහුගේ මගපෙන්වීම හා පාලනය යටතේ ක්‍රියා කරන නිසි සුදුසුකම් ලත් කවර හෝ විගණකවරයෙකුගේ හෝ විගණකවරුන්ගේ හෝ සේවය යොදගත හැක. *(අධිකාරියේ විගණනය.)*

(2) "අධිකාරියේ ගිණුම් විගණනය සඳහා ගෙවිය යුතු ගාස්තුවක් වේනොත් එම ගාස්තුව අධිකාරියේ අරමුදලින් දැරිය යුතුවේ."

(3) විගණකාධිපතිට හෝ අධිකාරියේ ගිණුම් විගණනය කිරීම සඳහා ඔහුට සහාය වන යම් අයෙකුට හෝ එම විගණනයේ කාර්යයන් සඳහා අවශ්‍ය වන සියලු පොත්පත්, මජ්පු තිරප්පු, කොන්ත්‍රාත්තු ගිණුම් වවුචර් හා වෙනත් ලියවිලි ලබා ගැනීමට හැකිවිය යුතු අතර, එවැනි කාර්යයන් සඳහා තමන්ගේ දැනුම ඇතුළත් වන කවර හෝ තොරතුරක් මණ්ඩලය හෝ එහි සාමාජිකයෙකු හෝ නිලධාරියකු හෝ විසින් සැපයිය යුතු වේ.

(4) මෙම වගන්තියෙහි "සුදුසුකම් ලත් විගණකවරයා" යනුවෙන් අදහස් වනුයේ–

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙකු වුවද, ඒ ආයතනය විසින් ගණකාධිකාරිවරයෙකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් වරලත් ගණකාධිකාරී සමාගමක එක් එක් හවුල්කරු ඒ ආයතනයේ සාමාජිකයෙකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරිවරයෙකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එම ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක් වේ.

29. විගණකාධිපති විසින් අධිකාරියේ ගිණුම් පරීක්ෂා කොට පහත සඳහන් කරුණු අඩංගු වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. එනම්–

(අ) තමන්ට අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් ලැබුනේ ද නැද්ද යන වග ;

(ආ) අධිකාරියේ කටයුතු පිළිබඳව නිවැරදි හා සාධාරණ අදහසක් ලබා ගැනීමට හැකිවන පරිදි වාර්තාවේ සඳහන් ගිණුම් නිසියාකාරව සකස් කර තිබෙන්නේ ද යන වග ;

(ඇ) තමන්ගේ හැඟීම් අනුව පළාත් සභාවට වැදගත් වන්නා වූ ගිණුම්වල අඩංගු යම් කරුණු හෝ අධිකාරියේ කටයුතු හා ගිණුම් පිළිබඳ ව පරීක්ෂණයේ දී හෙළි වූ වැදගත් කරුණු.

30. විගණනය කරන ලද ගිණුම් හා විගණකාධිපතිගේ වාර්තාව එක් එක් වර්ෂයේ දී ලැබුණු විට එම වාර්තාවට අදළ මුදල් වර්ෂය තුළ දී අධිකාරිය විසින් කරන ලද කටයුතු පිළිබඳ වාර්තාවද සමග එම ගිණුම් වාර්තාව ද අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළයුතු අතර, ඔහු විසින් එම ගිණුම් වලට අදළ මුදල් වර්ෂය ඉකුත් වී දොළොස් මසක් ඉකුත් වීමට පළමු ඒවායේ පිටපත් අමාත්‍ය මණ්ඩලයට හා පළාත් සභාවට ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතුය. *(විගණන වාර්තාව හා අධිකාරියේ වැඩ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාව අමාත්‍යවරයාට යැවිය යුතු බව.)*

31. මෙම ප්‍රඥප්තියෙහි අන්‍යාකාරයකින් දක්වා නැත්නම්– *(අර්ථ නිරූපණය.)*

"අමාත්‍යවරයා" යන්නෙන් වයඹ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයාද ;

"පළාත් සභාව" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාව ද අදහස් වේ.

11–99/3